14 වන පිටෙන්

කාරිය පාසල් ශිෂ්‍යාවකි. උත්තර පත්‍රකයේ මැද පිටුවකට රුපියල් 100/* ක මුදල් නෝට්ටුවක් අමුණා තිබිණ. එයට යටින් දුක්මුසු අඳෝනාවක් ලියා, සම්මාන සාමාර්ථයක් ලබාදෙන ලෙස බැගෑපත්ව ආයාචනයක්ද කර තිබිණ. මෙය දුටු වහාම උත්තර පත්‍රය මා වෙත යොමු කරන ලදී. එය සුපුරුදු ක්‍රමයට ලකුණු කරන ලෙස උපදෙස් දුනිමි. එය සාමාන්‍ය සාමාර්ථයක් ලබාගැනීමට අවශ්‍ය ලකුණු ලබාගෙන තිබුණු උත්තර පත්‍රයකි. පරීක්ෂකවරිය විසින් ලකුණු කළ පසු, මා ඒ සියල්ල නැවත බලා ලකුණු දීම නිවැරදි බව තීරණය කර, ලබාගත් ලකුණු සහ ශ්‍රේණිය, ලකුණු ලේඛනයේද සටහන් කර, ජර්නල සටහනක් යොදා, ලකුණු කළ උත්තර පත්‍රය පැකට්ටුවෙන් ඉවත් කර, මුදල් නෝට්ටුවද සමග රහස්‍යක කවරයක බහා ආවරණ ලිපියක්ද සහිතව විභාග දෙපාර්තමේන්තුවේ විමර්ශන ශාඛාව වෙත වැඩිදුර කටයුතු සඳහා යැවීමි. එම මුදල රජයේ ආදායමට බැරකළ බවත්, ශිෂ්‍යාවගේ විභාග ප්‍රතිඵල තාව කාලිකව අත්හිටුවා, විදුහල්පති මගින් අවවාදාත්මක ලිපියක්, දෙමාපියන්ටද පිටපතක් සහ මුදල් සඳහා කුවිතාන්සිය ක්ද සහිතව යවන ලද බව පෞද්ගලිකව දැනගතිමි.

මෙය සුළු වශයෙන් තැකිය හැකි සිද්ධියක් නොවේ. නොදැනුවත්කම නිසා වුවත් අල්ලසක් දීමට තැත් කිරීමේ වරදක් ලෙස සැලකිය හැකිය.

3. අයදුම්කරු විභාග අංකය දමා නොතිබීම

එක් මධ්‍යස්ථානයක උත්තර පත්‍ර ඇගයීම් කරද්දී, පරීක්ෂක වරයෙකුට, විභාග අංකය ලියා නොතිබුණු උත්තර පත්‍රයක් හමුවිය. එය පෞද්ගලික අයදුම්කරුවෙකුගේය. මෙම ගැටලුව ඉතාමත් සැලකිල්ලකින් සොයා බැලිය යුතු එකකි. පැකට්ටුවේ ඇති උත්තර පත්‍රවල විභාග අංක අනු පිළිවෙල වහාම සොයා බලා ලකුණු ලේඛනයද සමග සංසන්දනය කර බැලීමේදී, අනුමාන කළ හැකි අංකය සොයා ගත හැකිවිය. එසේ වුවත්, උත්තර පත්‍රයේ අංකය ඇතුලත් කිරීමට උත්තර පත්‍ර ලකුණු කිරීමේ යෙදී සිටින නිලධාරීන්ට අවසර නැත. මෙහිදී විභාග ශාලාවේදී වරදක් සිදුවී ඇති බව පෙනුනි.

විභාග ශාලාවේදී විෂයය සඳහා පිළිතුරු සැපයීමට නියමිත අයදුම්කරුවන්, ඇතුලත් වීමේ ලේඛනය සමග සසඳා බලා, එම අංක ලකුණු ලේඛනයේ ඇතුලත් කර යම්කිසි අයදුම්කරුවෙක් එම විෂයය සඳහා නොපැමිණියහොත් ලකුණු ලේඛනයේ අංකයට ඉදිරියෙන් නොපැමිණී යනුවෙන් ලියා, පැමිණීමේ ලේඛනයේද කතිරයකින් සටහන් කිරීම විභාග ශාලාධිපතිගේ වගකීමය. මෙහිදී උත්තර පත්‍රය නියමිත තැන තබා තිබුණත් එහි අංකය දමා නොතිබීම ගැන විමසිලිමත් වී නැත.

මෙම උත්තර පත්‍රය නියමිත අයදුම් කරු විසින්ම ලියන ලද්දක්ද යන්න අපට විසඳිය නොහැකිය. නියමිත ආකාරයට පරීක්ෂක වරයා ලවා උත්තර පත්‍රය ලකුණු කරවා, මමද නැවත පරීක්ෂාකර බැලුවෙමි. එයට සම්මාන ලකුණු ලැබී තිබුණි.

එම උත්තර පත්‍රයේ විශේෂ සටහනක්ද යොදා, අනුමාන විභාග අංකය සඳහන් ආවරණ ලිපියක්ද සකස් කර, වෙනම ලකුණු ලැයිස්තුවක ලකුණු සටහන් කර (අංකය නොදමා) විමර්ශන ශාඛාව වෙත වැඩිදුර කටයුතු සඳහා යැවීමි.

එම සිද්ධිය විභාග ශාලාධිපතිගේ නොසැලකිල්ල නිසා සිදුවී ඇති වරදක් බැවින් ඔහුගෙන් නිදහසට කරුණු අසා, වසර කිහිපයකට විභාග කටයුතු වලින් ඉවත් කරන ලද බව පසුව දැන ගතිමි.

අයදුම් කරුගේ විභාග ප්‍රතිඵල තාවකාලිකව අත්හිටුවා, ඔහු විභාග දෙපාර්තමේන්තුවට ගෙන්වා දිව්රුම් ප්‍රකාශයක් ලබාගෙන, අත් අකුරු ඔහුගේම බව තහවුරු වීමෙන් පසුව ප්‍රතිඵල නිකුත් කරන ලදී.

විභාග වල අනුවේදනීය සහ සාහසික සිද්ධිද බොහෝ විට දකින්නට ලැබේ.

**ලබන සන්නසේ දී අපි ඒ ගැන අවධානය යොමු කරමු.**

06 වන පිටෙන්

එය සැබවින්ම රාජකීය මංගල උත්සවය කණපිට හැරවූ, සම්මතයට අතුල් පහරක් එල්ල කළ, සමාජ අසාධාරණය දැඩිව හෙලා දුටු, සැබෑ ආගමික නායකයකු නම් මේ යයි කියා පෑ අපූරු දේශනයක් විය.

විශේෂයෙන්ම සාම්ප්‍රදායිකව යුද සෙනෙවියන් වන බ්‍රිතාන්‍යයේ රජ පවුලේ නායකයන් ඉදිරියේ යුද්ධය පිළිකෙව් කරන මෙන් ඔහු කළ ආයාචනය දශක ගණනාවක යුද්ධයකින් බැට කෑ ශ්‍රී ලංකාව වැනි රටකට ද කෙතරම් ගැලපෙන්නේ දැයි යන්න මට ක්ෂණිකව පහල වූ හැඟීමය.
ආදරය රජ කරන විට සහ කඩුව පලිහ ගඟ අද්දරට විසි කර දමනු ඇතැයි ඔහු පැවසුවේ හමුදා නිල ඇඳුමෙන් සැරසී සිටි මනමාලයා සහ අනාගත කිරුළ හිමි විලියම් කුමරු ද ඉදිරියේය.

(When love is the way we will lay down our swords and shields down by the riverside to study war no more)

ඇමෙරිකා එක්සත් ජනපදය තුළ ජාති වාදයට එරෙහිව හඬ නගන, සමරිසි ප්‍රජාවගේ විවාහය ඇතුළු අයිතීන් වෙනුවෙන් ප්‍රසිද්ධියේ පෙනී සිටින, මයිකල් කරි බිෂොප්වරයා මංගල උත්සවය කණපිට හරවද්දී ඔහුට ආරාධනා කළ මනාල යුවල එය සිනහසෙමින් එයට සවන් දුන්හ.

ආදරය රජයන විට බෞද්ධ, මුස්ලිම්, ක්‍රිස්තියානි, හින්දු, ජාති භේද, කුල භේද, ප්‍රාදේශීය භේද, වර්ණ භේද යනාදී මෙකී, නොකී අනේකවිධ බෙදීම් වෙනුවට ලොව සෑම දෙනාම එක පවුලක් ලෙසින් එකාවන්ව කටයුතු කරනු ඇති බවත් බිෂොප්වරයා සිනහ මුසු මුහුණින් යුතුව, රඟපාමින්, පැහැදිලි කළේය.

(Because when love is the way we actually treat each other" well" like we~re actually family)

රටේ අහිංසක පුරවැසියන් පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීමේ චෝදනා ලද්දවුන් නීතියේ රැහැනින් බේරාගැනීමට කෑ මොර ගසන "ආගමික නායකයන්" වෙනුවට, අතුරුදහන් වූ සැමියන් සොයා හඬන මවුවරුන්ට පරුෂ වචනයෙන් බැන වදින "ආගමික නායකයන්" වෙනුවට, ලේ වැගිරෙන යුද්ධයට සෙත් පිරිත් දෙසමින් ආවඩන "ආගමික නායකයන්" වෙනුවට, අතුරුදහන් කිරීම අපරාධයක් ලෙස නීති පැනවීමට විරෝධය පාන "ආගමික නායකයන්" වෙනුවට ශ්‍රී ලංකාවටත් මයිකල් කරි රදගුරුවරයා වැනි, ගල්කන්දේ ධම්මානන්ද හිමියන් වැනි, සැබෑ ආගමික නායකයන් කිහිප දෙනෙක්වත් සිටියේ නම් කෙතරම් කදිම දැයි මට සිතේ.

